සැබැවින්ම ඔබ ආගම් ලත් ජන පිරිසක් වෙත යන්නෙහිය. ඔබ ඔවුන් වෙත ගියෙහි නම් 'නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නොමැති බවට හා සැබැවින්ම මුහම්මද් අල්ලාහ්ගේ දූතයා බවට සාක්ෂි දරන මෙන්'

ඉබ්නු අබ්බාස් (රළියල්ලාහු අන්හුමා) විසින් වාර්තා කරන ලදී. අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) මුආද් ඉබ්නු ජබල් (රළියල්ලාහු අන්හු) තුමා යමන් දේශයට යැවූ අවස්ථාවේ එතුමාණෝ මෙසේ පැවසූහ: "සැබැවින්ම ඔබ ආගම් ලත් ජන පිරිසක් වෙත යන්නෙහිය. ඔබ ඔවුන් වෙත ගියෙහි නම් 'නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නොමැති බවට හා සැබැවින්ම මුහම්මද් අල්ලාහ්ගේ දූතයා බවට සාක්ෂි දරන මෙන්' ඔවුනට ඇරයුම් කරන්න. ඒ සඳහා ඔවුන් ඔබට කීකරු වූයේ නම්, සැබැවින්ම අල්ලාහ් ඔවුනට සෑම දහවලකම රාත්රියකම වාර පහක් සලාතය අනිවාර්යය කර ඇති බව ඔවුනට දන්වා සිටින්න. එයට ද ඔවුන් ඔබට අවනත වූයේ නම්, සැබැවින්ම ඔවුන් අතර ධනවතුන්ගෙන් ලබා එය ඔවුන්ගේ දුප්පතුන්ට පිරිනමන දානය ඔවුනට අල්ලාහ් අනිවාර්යය කර ඇති බව දැනුම් දෙන්න. එයටත්
ඔවුන් ඔබට අවනත වූයේ නම්, ඔවුන්ගේ ගෞරවණීය වස්තු පිළිබඳ ප්රවේසම් විය යුතුය. අසාධාරණයට ලක්වූවන්ගේ ප්රාර්ථනාවට ඔබ බියවන්න. සැබැවින්ම ඒ අතර හා අල්ලාහ් අතර කිසිදු තිරයක් නැත."
[صحيح] [متفق عليه]

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් මුආද් ඉබ්නු ජබල් (රළියල්ලාහු අන්හු) තුමා යමන් දේශයට, එහි වැසියන් අල්ලාහ් වෙත ඇරයුම් කරන කැඳවුම්කරුවකු හා ගුරුවරයකු ලෙස යැවූ කල්හි හෙතෙම කිතුනු ජන පිරිසක් මුණ ගැසෙන බවත් ඔවුන් වෙනුවෙන් සූදානම් විය යුතු බවත් ඔවුන් ඇරයුම් කිරීමෙහි දී වඩාත් වැදගත් දෑ පසුව වැදගත් දෑ යන අනුපිළිවෙලින් ආරම්භ කළ යුතු බවත් එතුමාණෝ ඔහුට පැහැදිළි කළහ. පළමු ව ප්රතිපත්තිය නිවැරදි කිරීම සඳහා හෙතෙම ඇරයුම් කර සිටියි: එය, නැමදුමට සුදුස්සා අල්ලාහ් හැර වෙනත් දෙවියෙකු නැත. සැබැවින්ම මුහම්මද් අල්ලාහ්ගේ දූතයාණන් බව ඔවුන් සාක්ෂි දැරීමට සැලැස්වීමෙනි. හේතුව ඔවුන් ඉස්ලාමයට පිවිසෙන්නේ එමගිනි. එයට ඔවුන් අවනත වූ විටෙක ඔවුනට සලාතය ස්ථාපිත කරන මෙන් නියෝග කළහ. 'තව්හීද්' හෙවත් ඒක දේව ප්රතිපත්තියෙන් පසු වඩාත්ම වැදගත් වගකීම වනුයේ එයයි. ඔවුන් එය විධිමත්ව ඉටු කළ විටෙක, ඔවුන් අතර සිටින පොහොසතුන්ගේ ධනයෙන් සකාත් ලබා ඔවුන්ගේ දිළිඳුන් අතර භාරදෙන මෙන් ඔවුනට නියෝග කර සිටියහ. පසුව එම ධනයෙන් වඩාත් උතුම් දේ ගැනීමෙන් එතුමාණෝ අවවාද කළහ. සැබැවින්ම ඒ අතරින් අනිවාර්යය වනුයේ මධ්යස්ත දෑය. පසුව අසාධාරණකම් කිරීමෙන් වැළකෙන මෙන් එතුමාණෝ ඔහුට අවවාද කළහ. එය, අසාධාරණයට ලක්වූවන්ගේ ශාපයට ඔහු ලක් නොවනු පිණිසය. සැබැවින්ම ඔහුගේ ප්රාර්ථනාව පිළිගනු ලබන්නක් වේ.

http://www.sunnah.global/hadeeth/si/show/3390